# සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය

## ඇයගේ ආර්ථික කටයුතු සම්බන්ධ භූමිකාව

ලීලානන්ද ද සිල්වා

### හැඳින්වීම

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1960 සිට 1965 දක්වා සහ 1970 සිට 1977 දක්වා වසර 12ක කාලයක් අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය නායිකාව ලෙස ක්‍රියා කළාය. මින් පළමුවන කාල පරිච්ඡේදයේ එතුමිය අගමැති තනතුරට අමතරව, ආරක්ෂක සහ විදේශ කටයුතු භාර ඇමති තනතුර ද දැරුවාය. 1970 - 1977 කාලයේ දී එතුමිය මීට අමතරව ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු ඇමතිනිය ලෙස ද ක්‍රියා කළාය. මෙම දෙවෙනි කාල පරිච්ඡේදයේ දී එතුමිය පළමු අවස්ථාවට වඩා ආර්ථික ප්‍රශ්න ගැන ක්‍රියා කිරීම වැදගත් කරුණකි. ඇයගේ අවධානය වඩා යොමු වූයේ ආර්ථිකයේ ප්‍රධාන ප්‍රවණතා කෙරෙහිය. දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශයන්ගේ විස්තරාත්මක කළමනාකරණය පිළිබඳ වගකීම වෙනත් ඇමතිවරුන් වෙත පවරනු ලැබීය. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වු වැදගත් ප්‍රශ්න මිස අමාත්‍යාංශ ප්‍රශ්න ගැන අගමැතිනියගේ මැදිහත් වීමක් නොතිබිණ. වමට බර රජයන්හී නායකත්වය දැරූ ඇය සමාජවාදියෙක් දැයි බොහෝ අය ප්‍රශ්න කර තිබේ. බ්‍රිතාන්‍ය - පෝලන්ත ජාතික දාර්ශනිකයකු වූ ලේස්ජෙක් කොලකවුස්කිගේ ප්‍රකාශයක් එතුමියගේ ස්ථාවරය මැනවින් ගෙනහැර පායි. ඔහු සමාජවාදය නිර්වචනය කරනුයේ "වැළැක්විය හැකි දුක් වේදනා ඇති කරන තත්ත්වයන් ක්‍රමානුකූලව ඉවත් කිරීමේ අප්‍රතිහිත අධිෂ්ඨානය" ලෙසිණි. සෑම විටම ඇගේ අරමුණ මෙය විය. මම එතුමිය සමග 1970 - 1977 කාලයේ දී රාජකාරියෙහි නිරත වීමි. මාගේ ප්‍රධාන වගකීම වූයේ ජාත්‍යන්තර ආර්ථික සම්බන්ධතා කළමනාකරණයේ දී එතුමියට සහාය වීමයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ප්‍රධානත්වය දැරූ පාලන කාලයන්

දෙකෙහි ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් මෙහිදී කිරීමට මම අදහස් නොකරමි. එම කර්තව්‍යය අනාගත ආර්ථික ඉතිහාසඥයෙකු විසින් පොත් ගණනාවකින් ලියා තබනු ඇත. මෙහිදී මාගේ අභිලාශය නම් එතුමිය සමග ආර්ථික ප්‍රශ්න සම්බන්ධයෙන් රාජකාරි කටයුතු කිරීමේ දී මාගේ අත්දැකීම් අතිශය පුද්ගලික වූ දෘෂ්ටියකින් ගෙනහැර පෑමය.

## කාලය සහ අවස්ථාව

බණ්ඩාරනායක මැතිනිය රටෙහි නායකත්වය දැරූ එක්දහස් නමසිය හැට සහ හැත්තෑව කාලයන්හී දී අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්ති යල් පැන ගිය ප්‍රතිපත්ති ලෙස නූතන විමර්ශකයකුට පෙනෙනු ඇත. එම නිසා ඒ වකවානුවේ කලාපීය සහ ගෝලීය තත්ත්වය දැනට දක්නට ලැබෙන තත්ත්වයෙන් කෙතරම් වෙනස් වී තිබුණේ ද යන්න අවධාරණය කිරීම වැදගත්ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ආයතන විසින් එවකට අනුදක්නා ලද ආර්ථික දර්ශනය අනුව සමාජ ආර්ථික සංවර්ධනය අරබයා රාජ්‍ය අංශයේ කැපී පෙනෙන මැදිහත් වීමක අවශ්‍යතාවය හුවා දැක්වීය. ඒ අනුව රජය සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන ක්‍රියාකරුවකු ලෙස පිළිගැණුනි. රජය ආර්ථිකයට මැදිහත් වීම සම්මතයක් ලෙස සංවර්ධනය වෙමින් පැවති රටවල පිළිගැනීම විය. හැත්තෑව දශකය ගෙවීයත්ම මෙම රටාව ප්‍රකටව පෙනෙන පරිදි වෙනස් විය. වර්තමානයේ මෙන් රටට විදේශ විනිමය සපයන ප්‍රේෂණ ආර්ථිකය බණ්ඩාරනායක මැතිනියගේ යුගයේ ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණයක් නොවීය. එවකට පැවතියේ ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයයි.

ක්‍රමසම්පාදන හා ආර්ථික කටයුතු ඇමතිනිය ලෙස බණ්ඩාරනායක මැතිනියගේ කාර්යයසාධනය ගැන මෙනෙහි කරන විට එවකට ශ්‍රී ලංකාවේ පැවති පාර්ලිමේන්තු කැබිනට් ක්‍රමයේ ප්‍රමුඛතා සැලකිල්ලට ගත යුතුය. එම වකවානුවේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලැබුවේ හුදෙකලාව නොව, කැබිනට් මණ්ඩලයේ කැමැත්ත ලැබෙන ආකාරයට, මුදල් අමාත්‍යාංශයේ අදහස් විමසන ක්‍රියාවලියක් තුළිණි.

ඇතැම් අවස්ථාවන්හී දී එතුමිය බලවත් පෞරුෂයක් පාමින් තීරණ ගැනීමෙහිලා ක්‍රියාකළ ද, ඇයගේ රජයේ ආර්ථික ප්‍රතිපත්ති සාමූහික ප්‍රයත්නයක් මිස තනි ප්‍රයත්නයක් නොවීය. සැලකිල්ල යොමු විය යුතු තවත් කරුණක් නම්, එතුමියගේ පළමු පාලන සමයේ පසු භාගයේ දීත්, දෙවැනි පාලන සමයේ වැඩි කාලයක් තුළ දීත් ඇයට ක්‍රියාකිරීමට සිදුවූයේ සමාජ ආර්ථික කරුණු පිළිබඳව විවිධ අදහස් දැරූ වෙනස් ප්‍රවේශයන් අනුදත් දේශපාලන වශයෙන් සන්ධානගත හවුල්කරුවන් සමගය. මෙසේ සන්ධාන ගතවූ සියළු දේශපාලන පක්ෂ ආර්ථික කටයුතු පිළිබඳ ඇයගේ මතිමතාන්තර සමග සෑම විටම එකඟත්වයන් දැක්වූයේ නැත. එවැනි තත්ත්වයක් යටතේ ඇතැම් විට තම මතයේම එල්බ නොගෙන සන්ධානය ආරක්ෂා කිරීම සඳහා තම ස්ථාවරය වෙනස් කිරීමට එතුමියට සිදුවිය. මින් පෙනී යන්නේ බණ්ඩාරනායක මැතිනියගේ පාලන කාලයට පසුබිම් වූ දේශපාලන වාතාවරණය සහ ඌරුව අද දක්නට තිබෙන විධායක ජනාධිපති පාලන ක්‍රමයට හාත්පසින්ම වෙනස් වූවක් බවයි. තමන් උචිත යැයි සලකන ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීම වර්තමාන විධායකය සතු නිදහස් බලය ඇයට තිබුණේ නැත. ඇය නායකත්වය දැරුවේ කැබිනට් මණ්ඩලයක් විසින් මෙහෙයවනු ලැබූ, සහායක කණ්ඩායමක් අතර පොදු වගකීමට සම්බන්ධ පාලන තන්ත්‍රයකටය. ඒ අනුව තම කැබිනට් සගයිනට තම තමන්ගේ අමාත්‍යාංශයන් ආශ්‍රයෙන් තමන්ට අභිමත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සෑහෙන බලයක් තිබුණි.

කෙසේ වුව ද 1970 - 1977 කාලයේ දී ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු ඇමති ලෙස එතුමියට අත්පත් වූ අමතර බලය සහ වගකීම් හේතුවෙන් කැබිනට් මණ්ඩල රැස්වීම්වල දී මුල් වාරයට වඩා බෙහෙවින් වැඩි බලපෑමක් කිරීමට එතුමියට ශක්තියක් ලැබුණි. මේ අවස්ථාවේ දී කැබිනට් න්‍යාය පත්‍රය ආර්ථික ප්‍රශ්න සලකා බැලීමට වැඩි අවකාශයක් ලබා දුන්නේය. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වූ සෑම පත්‍රිකාවක්ම ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයට යොමු කළ යුතුව තිබුණ අතර ඒවාට අදාළ අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද අවශ්‍ය විය. මෙම කැබිනට් පත්‍රිකා තියුණු පරීක්ෂණයකට භාජනය කර සෑම සතියකම බදාදාට යෙදුණ කැබිනට් මණ්ඩල රැස්වීමේ දී සාකච්ඡා කිරීමට නියමිත ප්‍රශ්න පිළිබඳව කෙටි සටහනක් එතුමිය වෙත ඉදිරිපත් කිරීමේ වගකීම ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පවරනු ලැබීය. අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් මෙන්ම ආර්ථික කටයුතු අංශයේ අධ්‍යක්ෂ තනතුර ඉසිලූ මා වෙත මෙම කෙටි සටහන ඉදිරිපත් කිරීමේ වගකීම පැවරිණි. ක්‍රමසම්පාදන හා ආර්ථික කටයුතු ඇමතිනියගේ ප්‍රධානත්වයෙන් සඳුදා පවත්වනු ලැබූ අමාත්‍යාංශ රැස්වීම, බදාදා කැබිනට් මණ්ඩල රැස්වීමට අවශ්‍ය සූදානම් වීම සඳහා එතුමිය විසින් යොදා ගන්නා ලදී. මනාව සංවිධානය කෙරුණ, ඉක්මන් උද්‍යෝගී ස්වරූපයක් ගත් මෙම රැස්වීම්වල දී සංවරශීලීව තර්ක කිරීම් සහ විවාද බොහෝ සෙයින් දක්නට තිබුණි. ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මෙම සියළු රැස්වීම්වල දී අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් මහාචාර්ය එච්.ඒ. ද ඇස්. ගුණසේකර සහ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ආනන්ද මීගම යන මහතුන් අභ්‍යන්තර ආර්ථික ප්‍රශ්න ගැන ඇමතිතුමියට උපදෙස් දීමේ දී ඉමහත් කාර්යභාරයක් ඉටු කළහ.

## දේශීය ආර්ථික ප්‍රතිපත්ති

මූල්‍ය ස්ථාවරභාවය ආරක්ෂා කිරීමට කැපවී සිටි බණ්ඩාරනායක මැතිනිය උද්ධමනය ගැන මහත් සැලකිල්ලක් දැක්වූවාය. මෙම වකවානුවේ දී දක්නට ලැබූ උද්ධමනකාරී තත්ත්වයට හේතු වූයේ විශේෂයෙන් ආහාර ද්‍රව්‍ය සහ ඛනිජ තෙල් යනාදී ආයාත භාණ්ඩ සහ සේවාවන්ගේ මිල ඉහළ නැගීම වැනි බාහිර බලපෑම්ය. ආහාර සහ ඛනිජ තෙල් ආශ්‍රිත අර්බුද 1970 දශකයේ මුල් වසරවල දී ප්‍රකට ලක්ෂණයක් විය. ඒවාට මුහුණ දීමට දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද අභීත ප්‍රයත්නයක් දැරීමට බණ්ඩාරනායක මැතිනියට සිදුවිය. ශ්‍රී ලංකාවේ අපනයන භෝගයන්ට අවාසි ආකාරයට වෙළෙඳ අනුපාතය වෙනස් වීම මේ අවධියේ අවධානය යොමු වූ ප්‍රධාන ගැටළුවක් විය. මෙම ප්‍රශ්නය අරභයා ක්‍රියා කිරීමට ජාත්‍යන්තර වශයෙන් සම්මුතියක් ගොඩනැගීමට ඇය මහත් උනන්දුවෙන් ක්‍රියා කළාය. එතුමිය සාමාන්‍ය වශයෙන් ආර්ථිකයේ කළමනාකරණය පිළිබඳ වගකීම්, මුදල් අමාත්‍යාංශයට සහ මධ්‍යම බැංකුවට පැවරූ අතර, අවශ්‍ය අවස්ථාවන්හී දී ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු ඇමතිනිය ලෙස නොපැකිලිව තම මතය ඉදිරිපත් කිරීමට නැගී සිටියාය. මෙම කාර්යයන්ට මම සෘජුව සහභාගී වූ බැවින් එම අවස්ථා කීපයක් සටහන් කිරීමට මම අදහස් කරමි.

සමාජ ආර්ථික අංශය අරභයා සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ දෙවන පාලන සමයේ දී ගනු ලැබූ වැදගත් පියවරක් ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණය සඳහන් කළ හැක. 1971 කැරැල්ල රජය විසින් විග්‍රහ කරනු ලැබුවේ වෙනත් කරුණුවලට අමතරව, ඉඩම් ප්‍රතිසංස්කරණය මගින් ආර්ථික සහනයක් ලබා ගැනීමේ උපාය මාර්ගයක් ලෙසය. ඩඩ්ලි සියර්ස්ගේ ප්‍රධානත්වයෙන් 1971 වසරේ දී ලංකාවට පැමිණි එක්සත් ජාතීන්ගේ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දූත පිරිස ද තරුණ අසහනයට පිළිතුරක් ලෙස මෙම ක්‍රියාමාර්ගය නිර්දේශ කළහ. (බණ්ඩාරනායක මැතිනිය, අරලියගහ මන්දිරයේ දී සියර්ස් දූත පිරිසේ රැස්වීමක සභාපතිත්වය දරමින් සිටියදී සන්නද්ධ කැරැල්ල ගැන දැනුවත් කිරීම විස්මිත සහ සිද්ධියක් වන අතර එම දැනුම් දීමත් සමග රැස්වීම අතහැර දැමිණි.)

1970 - 1977 රජයේ ඉඩම් ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය අනපේක්ෂිත ප්‍රතිවිපාක රජයට ගෙන දීමට හේතු විය. ඉන් එකක් නම් පාරම්පරික ඉඩම් හිමි පංතිය ශ්‍රී ලංකා දේශපාලන පොර පිටියෙන් ඉවත් කිරීමය. බණ්ඩාරනායක මැතිනිය ද ඉඩම් ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියෙන් පාඩු විඳීමට සිදු වූවන්ගෙන් අයෙකි. එතුමියට සහ එතුමියගේ පවුලේ අයට ඉඩම් සැලකිය යුතු ප්‍රමාණයක් රජයට භාර දීමට සිදුවිය. ශ්‍රී ලංකාවේ වෙනත් කිසිම රාජ්‍ය නායකයෙක්වත් මෙවන් පෞද්ගලික පරිත්‍යාගයක් කර නොමැත.

ඉඩම් ප්‍රතිසංස්කරණ ආඥා පනත යටතේ තේ සහ රබර් වතු ජනසතු කිරීමේ වැදගත් අංශයක් වූයේ 'රන් පවුම්' සමාගම් ජනසතු කිරීමයි. බ්‍රිතාන්‍ය සමාගම් සීයයකට වැඩි සංඛ්‍යාවකට ඉඩම් අක්කර එක් ලක්ෂ විසිපන්දහසක් පමණ අයිති වී තිබුණි. ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය අතර පැවති සුහද සම්බන්ධතාවයට හානියක් නොවන පරිද්දෙන් මෙම සමාගම්වලට වන්දි ගෙවීමේ ප්‍රශ්නය කඩිනමින් විසඳීම ගැන බණ්ඩාරනායක මැතිනිය උනන්දු වූවාය. මේ ගැන මෙනෙහි කරන විට අගමැතිනිය එවකට බ්‍රිතාන්‍ය අගමැති හැරල්ඩ් විල්සන් මුණගැසුණ අවස්ථාව මාගේ සිහියට නැගේ. ඔහු අගමැතිනියට කියා සිටියේ වතු රජයට ගැනීම ගැන තමා කිසිවක් ප්‍රකාශ නොකරන නමුත්, වතු අයිතිකරුවනට සුදුසු පරිදි වන්දියක් ගෙවීම වැදගත් වන බවයි. තම මගපෙන්වීම යටතේ මෙම ප්‍රශ්නය ගැන ක්‍රියා කිරීමේ වගකීම අගමැතිනිය ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පැවරුවාය. වන්දි ගෙවීමේ කටයුතු භාරව ක්‍රියා කිරීමට මහචාර්ය එච්.ඒ. ද ඇස්. ගුණසේකරගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කරන ලදී. වෙනත් රජයේ ආයතන කිහිපයක නියෝජිතයින් සාමාජිකයන් ලෙස ක්‍රියා කළ මෙම කමිටුවේ සාමාජිකයෙක් වූ මම එහි ලේකම් ලෙස ක්‍රියා කළෙමි. මෙම වැදගත් කරුණ ගැන බ්‍රිතාන්‍යය සහ ශ්‍රී ලංකාව අතර කෙරුණ විවිධාකාර සාකච්ඡා විස්තර වශයෙන් මෙහි දක්වා සිටීම අනවශ්‍යයය. මෙම ප්‍රශ්නය දෙපක්ෂයේම සෑහීමට හේතුවන පරිදි නිරාකරණය කළ බව පමණක් සඳහන් කළ යුතුය. වසර හතරක කාලයක් තුළ වන්දි වශයෙන් පවුම් මිලියන හතරක් ගෙවීමට ශ්‍රී ලංකාවට සිදුවිය. එනම් අක්කරයකට පවුම් 42ක් පමණය. අවශ්‍ය ආයෝජන සහ තේ කර්මාන්තයේ වර්ධනය ඇණහිටීමට හේතු වූ මෙම පටලැවිලි සහිත ප්‍රශ්නය මෙලෙස ඉතාමත් වාසිදායක ලෙස විසඳනු ලැබීය.

බණ්ඩාරනායක මැතිනියගේ විශේෂ අවධානයට පාත්‍ර වූ වෙනත් ප්‍රශ්නයක් නම් බුද්ධි ගලනයයි. මධ්‍යම පාන්තික වෘත්තීයවේදීන් සැලකිය යුතු සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවෙන් පිටවී ගිය අතර, මෙම ගලනය සීමා කිරීමට රජය පැනවූ බාධක අපොහොසත් විය. මෙම ප්‍රශ්නය ගැන ක්‍රියාකිරීමට ඇමති මෛත්‍රීපාල සේනානායකගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් එතුමිය විසින් පත්කරනු ලැබුවාය. මෙම කමිටුවට අවශ්‍ය පහසුකම් සලසා සහාය වීමේ වගකීම ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පැවරිණි. සියළු දෙනාගේම එකඟත්වය ලැබුණ කමිටු වාර්තාවේ නිර්දේශ හේතු කොට

ගෙන බුද්ධි ගලනය ආශ්‍රිතව පනවා තුබුණ බාධක ලිහිල් කර කෙටි කාලීන විදෙස් සේවය සඳහා වෘත්තිකයන්ට අනුබල දීම සිදුවිය. කමිටු නිර්දේශයනට එකඟත්වය පල කළ මැතිනිය කියා සිටියේ බුද්ධි ගලන ප්‍රශ්නය ශ්‍රී ලංකාවට සීමා වූවක් නොව දියුණු වෙමින් පවතින රටවල් සියල්ලටම පොදු ප්‍රශ්නයක් බවයි. මේ පිළිබඳ අමතර පියවරක් ලෙස, 1975 වසරේ දී ජැමෙයිකාවේ කිංස්ටන් නගරයේ පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීමට ඉදිරිපත් කිරීමට මෙම කරුණු අළලා ලියවිල්ලක් සකස් කරන ලෙස එතුමිය මට උපදෙස් දුන්නාය. සුදුසුකම් ලත් වෘත්තිකයන්ගේ සංක්‍රමනයෙන් වාසි ලබන රටවල් එම වෘත්තිකයන් සපයන රටවලට කෙරෙන යම් වන්දි ප්‍රදානයක් ලෙස එම රටවල වෘත්තිකයන් සැපයීම වැඩි කිරීමට ඉවහල් වන පහසුකම් සැලසිය යුතු බවට යෝජනාවක් මෙම ලියවිල්ලට ඇතුළත් විණි.

1965 එක්සත් ජාතික පක්ෂ රජයේ නිර්මාණයක් වූ ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය, පොදු ජනතාවගේ අවශ්‍යතාවයනට වඩා සමීප වන අන්දමට ප්‍රතිනිර්මාණය කිරීම ගැන බණ්ඩාරනායක මැතිනිය මහාචාර්ය එච්.ඒ. ද එස්. ගුණසේකරයන් උනන්දු කළාය. මේ අනුව මෙම අමාත්‍යාංශය තුළ රැකී රක්ෂා අවස්ථා ජනනය කිරීම සඳහා රැකියා අංශයක් ද, ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අංශයක් ද පිහිට වූ අතර මෙම දෙවැනි අංශය යටතේ සෑම කච්චේරියකම සැලසුම් කාර්යාලයක් පිහිටවනු ලැබීය. ක්‍රමසම්පාදන කාර්යයන් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය මට්ටමට විමධ්‍යගත වූ පළමු අවස්ථාව මෙය වේ. ප්‍රාදේශීය සංවර්ධන අංශයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වූ මෙම කාර්යාලය විසින් සමාජ ආර්ථික අත්හදා බැලීම් වශයෙන් ප්‍රාදේශීය මට්ටමෙන් ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය, අමාත්‍යාංශයේ මෙන්ම ප්‍රාදේශීය උප ඒකකයන්හී සේවය කිරීමට වෘත්තීය සුදුසුකම් ඇති අය බඳවා ගැනීමට හැකිවන පරිදි පරිපාලන සේවයට සමාන්තරව සැලසුම් සේවයක් ස්ථාපිත කළේය. මේ අනුව 1970 - 1977 කාලය තුළ ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ පූර්ණ වෙනසක් සිදු වූ බව පැහැදිලිය. මෙම සියළු පියවරවලට අදාළ ඇමතිනිය ලෙස බණ්ඩාරනායක මැතිනියගේ සහාය සහ අනුමැතිය ලැබුණි. ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය, තම ජාත්‍යන්තර වගකීම් පෙරසේම නොපිරිහෙලා ඉටුකළ අතර නව ප්‍රවනතාවක් ලෙස එය දේශීය, බිම් මට්ටමේ අවශ්‍යතාවනට වඩා සමීප විය. බණ්ඩාරනායක මැතිනිය මෙම අමාත්‍යාංශය, නිර්යාත ප්‍රවර්ධනය ගැනද සක්‍රීයව මැදිහත් වීමට පෙළඹවීය. ඇයගේ මතය වූයේ ශ්‍රී ලංකාව අපනයන ප්‍රවර්ධනයට ප්‍රමාණවත් අවධානයක් දී නොමැති බවය; විශේෂයෙන්ම ප්‍රධාන අපනයන වෙළෙඳ පොළවලට වඩා දියුණු කළ ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක භාණ්ඩ යොමු කිරීම අතපසු වී ඇති බවය. මෙම වැදගත් කරුණ ගැන වඩා පුළුල්ව ක්‍රියාකිරීම සඳහා එතුමිය අමාත්‍යාංශය තුළ අපනයන ප්‍රවර්ධන මණ්ඩලය ස්ථාපනය කළාය.

## ජාත්‍යන්තර ආර්ථික සබඳතා

බණ්ඩාරනායක මැතිනිය තම දෙවැනි පාලන කාලය වූ 1970 - 1977 වකවානුවේ දී ලංකා ඉතිහාසයේ එතෙක් මෙතෙක් දක්නට නොලැබුණ ආකාරයේ ක්‍රියාශීලී ප්‍රතිපත්තියක් විදේශ සබඳතා අරබයා අනුගමනය කළාය. ජාත්‍යන්තර සබඳතා ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව අද්විතීය භූමිකාවක් ඉටුකළ යුතුය යන මතයෙහි පිහිටා, නොබැඳි ව්‍යාපාරය, 77 කණ්ඩායම, පොදු රාජ්‍ය මණ්ඩලය යනාදී ආයතනයන් මගින් තමන්ට ලබාගත හැකි සියළු සහාය සහ සම්පත් උපරිම වශයෙන් ලබාගැනීමට ක්‍රියා කළාය. ඉහත සඳහන් සියළු ආයතනයන්ගේ මෙන්ම එක්සත් ජාතීන්ගේ සංගමය තුළ ද, ශ්‍රී ලංකාවට කැපී පෙනෙන ආකාරයට ක්‍රියා කිරීමට හැකි විය. උතුර - දකුණ සාකච්ඡාවන්ගේ උච්ඡ අවස්ථාවක් ලෙස දැක්විය හැකි 1970 - 1977 කාලයේ දී නව ජාත්‍යන්තර ආර්ථික පිළිවෙළක අවශ්‍යතාව හුවා දැක්විණි. ජාත්‍යන්තර වෙළෙඳාමේ දී වෙළෙඳ භෝගයන්ට හිමි තත්ත්වය මෙම සාකච්ඡාවන්හී වැදගත් අංශයක් විය. මෙම සාකච්ඡාවන් වඩා අර්ථවත් කර අපේක්ෂිත අරමුණ මුදුන් පමුනුවා ගැනීමට රුකුලක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රබල ආයතනයක් ලෙස එක්සත් ජාතීන්ගේ වෙළෙඳාම සහ සංවර්ධනය පිළිබඳ සම්මේලනය "අන්ක්ටෑඩ්" බිහිවිය. නොබැඳී ජාතීන්ගේ ව්‍යාපාරයේ සභාපතිත්වයට හිමිකාරිය ලෙසත්, පසුව එහි සභාපතිනිය ලෙසත් බණ්ඩාරනායක මැතිනිය එක්සත් ජාතීන්ගේ මෙම කටයුතුවල පූර්ණ වශයෙන් නියැලී සිටියාය. ඇත්ත වශයෙන් ශ්‍රී ලංකාවේ ආචාර්ය ගාමිණී කොරයා අතිශය වැදගත් "අන්ක්ටෑඩ්" මහලේකම් තනතුරට 1973 දී පත්වූයේ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ක්‍රියා පටිපාටිය හේතුවෙනි. ආචාර්ය කොරයාගේ සේවා කාලය 1976 ඔබ්බට දීර්ඝ කිරීමට එතුමිය පෞද්ගලිකව එක්සත් ජාතීන්ගේ මහලේකම් කුර්ට් වොල්ඩ්හයිම්ට කථා කොට මහත් පරිශ්‍රමයක් දැරීය. මා මේ ගැන හොඳින් දන්නේ එතුමියට ගෞරව කිරීමට වොල්ඩ්හයිම් මහලේකම් තුමා පැවැත් වූ සාදයක දී මෙම කරුණ ගැන කථාකරන විට මා එතුමිය සමග සිටිය බැවිණි.

ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලට බණ්ඩාරනායක මැතිනිය මෙතරම් සක්‍රීය ලෙස මැදිහත් වූයේ දුෂ්කරතාවයනට මුහුණ දීමට සිදු වූ අවධියක දී ලංකාවට හැකි පමණ වාසි ජාත්‍යන්තරව ලබා ගැනීමේ අභිලාශයෙන්ය. එතුමියගේ විදේශ ප්‍රතිපත්තිය හුදු ජාත්‍යන්තර දේශපාලනයට සීමා නොවීය. ඇය විදේශ ප්‍රතිපත්තියට ආර්ථික නැඹුරුවක් දීමට සැලකිලිමත් විය. අගමැති තනතුරට අමතරව එතුමිය රාජ්‍ය ආරක්ෂක සහ විදේශ කටයුතු මෙන්ම ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය ධූර ද ඉසිලූ හෙයින් විදේශ ප්‍රතිපත්තිය ජාත්‍යන්තර දේශපාලන සහ ආර්ථික සංවර්ධන යන ද්විත්ව පරමාර්ථයන්ම ආවරණය වන අන්දමට හැසිර වීමට අතිශයින්ම සුදුසු තත්ත්වයක් ඉසිලීය. ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශය, ජාත්‍යන්තර ආර්ථික ප්‍රශ්න පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය සමග සමීපව කටයුතු කරන බවට ඇය වගබලා ගත්තාය. වෙනත් රටවල් සමග කෙරෙන ද්වි-පාර්ශ්වික සාකච්ඡා මෙන්ම නොබැඳි ජාතීන්ගේ සමුළුව, 77 කණ්ඩායම හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි බහු පාක්ෂිය සංවිධාන සමග කෙරෙන සාකච්ඡාවල දී ද, ආර්ථික කටයුතු අංශයේ සක්‍රීය දායකත්වය එතුමිය සැම විටම අගය කළාය; දිරිමත් කළාය. අමාත්‍යාංශ දෙක අතර සමීප සහයෝගිතාවයක් ඇති කිරීමට අගමැති ලේකම් එම්.ඩී.ඩී. පීරිස් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ඩබ්.ටී. ජයසිංහ සහ විදේශ කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් ආතර් බස්නායක යන මහතුන්ගේ ප්‍රබල සහයෝගය මහෝපකාරී විය.

ආසියාව සහ ඈත පෙරදිග සඳහා වන ආර්ථික කොමිසමෙහි (ඉකාෆ්) 29 වැනි වාර්ෂික සැසිවාරය 1974 මාර්තු මස කොළඹ දී පැවැත්වුණි. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රථම වරට පවත්වනු ලැබූ ජාත්‍යන්තර රැස්වීම මෙය විය. බණ්ඩාරනායක මැතිනිය මෙහිදී පැවැත් වූ මූලාරම්භක දේශනයට වැදගත් යෝජනා දෙකක් ඇතුළත් විය. මින් පළමුවැන්න නම්, දියුණු වෙමින් පවතින රටවලට පොහොර සහනාධාරය යොමු කිරීම සඳහා ලෝක පොහොර අරමුදලක් ඇති කිරීමයි. දෙවැනි යෝජනාව වූයේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලක් ස්ථාපනය කිරීමයි. මෙම අවධියේ දී තෙල් මිල සීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් විශාල පොහොර අර්බුදයක් පැනනැග තිබුණි. එතුමියගේ අභිලාශය වූයේ ලෝක පොහොර අරමුදල සඳහා 1974 ඉදිරිපත් කෙරුණ යෝජනාව එම වසරේම පසු දිනක රෝමයේ පවත්වන්නට නියම වී තිබුණ එක්සත් ජාතීන්ගේ ආහාර සම්මේලනයේ දීත්, පසුව එක්සත් ජාතීන්ගේ සංගමයේ දීත් සාකච්ඡාවට භාජනය කර කෙසේ හෝ ක්‍රියාත්මක කිරීමය.

බණ්ඩාරනායක මැතිනියගේ යෝජනාව රෝමයේ පැවැත්වුණ ලෝක ආහාර සම්මේලනයේ දී ද සාකච්ඡා කරන ලදී. ජාත්‍යන්තර පොහොර සැපයුම් ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකාවත්, නවසීලන්තයත් ඒකාබද්ධව, එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමේ දී යෝජනාවක් ඉදිරිපත් කිරීම දක්වා මෙම කරුණ ගෙනයනු ලැබීය. මෙම ආයතනය පසුව ලෝක ආහාර සහ කෘෂිකර්ම සංවිධානය තුළ පිහිටවන ලද නමුත්, විශේෂයෙන් බහුජාතික පොහොර සමාගම්වල බලපෑම් හේතුවෙන් එහි ප්‍රගතිය සහ එහි කාර්යසාධනය මන්දගාමී විය.

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලක් (ඉෆාඩ්) ස්ථාපනය කිරීම සඳහා වූ බණ්ඩාරනායක මැතිනියගේ ඉහත සඳහන් දෙවැනි යෝජනාවේ ප්‍රධාන අපේක්ෂාව වූයේ වාරිමාර්ග ප්‍රවර්ධනය සඳහා අරමුදල් ලබා ගැනීමයි. ඉෆාඩ් ස්ථාපනය කිරීම සඳහා රෝම නගරයට රැස් වූ ආරම්භක කමිටුව වෙත ඉදිරිපත් කෙරුණ පළමුවැනි ලියවිල්ල නම්, ඒ පිළිබඳව ශ්‍රී ලංකාවේ යෝජනාවයි. ප්‍රාථමික කමිටුවේ රැස්වීම් වාර්තා අතර එම ලියවිල්ල දක්නට ඇත. පසුව ඉෆාඩ් පිහිටවනු ලැබුව ද, ඒ බණ්ඩාරනායක මැතිනිය අපේක්ෂා කළ ආකාරයට නොවේ. එතුමියගේ අදහස වූ පරිදි එය වාරිමාර්ග සංවර්ධනයට සීමා වූයේ නැත. එහි කාර්යභාරය පොදුවේ කෘෂිකාර්මික සංවර්ධනය ආවරණය වන පරිදි පුළුල් විය. කෙසේ වුව ද, 1974 ඉකැෆේ සම්මන්ත්‍රණයේ දී බණ්ඩාරනායක මැතිනිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා දෙක හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය හා සම්බන්ධ ආයතන ආශ්‍රයෙන් තියුණු රාජ්‍යතාන්ත්‍රික වැඩ කොටසක නිරත වීමට ශ්‍රී ලාංකීය නිලධාරීන්ට සිදුවිය. ජාත්‍යන්තර ආර්ථික සබඳතා ප්‍රවර්ධනයේ දී පොදුවේ කෘෂිකාර්මික ප්‍රශ්න පිළිබඳව එතුමියගේ සක්‍රීය මැදිහත් වීමට ප්‍රණාමයක් වශයෙන් ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් එතුමියට ඉමහත් ගෞරවයක් ලෙස සැලකෙන 'සේරේස්' පදක්කම ප්‍රදානය කරන ලදී.

1976 අගෝස්තු මස කොළඹ පවත්වන ලද පස්වැනි නොබැඳි ජාතීන්ගේ මහා සමුළුවේ දී එහි සභාපතිත්වයට බණ්ඩාරනායක මැතිනිය පත්විය. ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයට ද, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ට ද, ඇයගේ උපදෙස් වූයේ නොබැඳි ජාතීන්ගේ සමුළු සාකච්ඡාවන් හැකිතාක් දුරට ආර්ථික අංශයට යොමු කළ යුතු බවයි. මන්දයත් මෙම වකවානුවේ දී දියුණු වෙමින් පවතින රටවල ප්‍රගතියට එරෙහි වූ කරුණු ගැන මනා අවබෝධයක් තුබුණ එතුමිය සමුළුවේ සාකච්ඡා සමකාලීන දේශපාලනමය ප්‍රශ්නවලට ප්‍රමුඛත්වයක් දීම අනුමත කළේ නැත. එම නිසා සමුළුවේ ආර්ථික කමිටුවට දේශපාලන කමිටුවට තරමම වැදගත් ස්ථානයක් දීමට වගබලා ගත්තාය. පස්වැනි සමුළුවේ මූලාරම්භක කථාවේ දීම එතුමිය තුන්වන ලෝකය වෙනුවෙන් වාණිජ සහ ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ බැංකුවක් ස්ථාපනය කළ යුතු යැයි යෝජනා කළාය. මෙම යෝජනාව ඉදිරියට ගෙන යෑමට අන්ක්ටාඩ් ආයතනයට අවශ්‍ය විය. කෙසේ වුව ද, 1977 වසරේ දී ශ්‍රී ලංකාවේ සිදු වූ ආණ්ඩු පෙරළියත් සමග මෙම ප්‍රයත්නය කෙළවර විය.

ජාත්‍යන්තර සබඳතා අංශයට ආර්ථික නැඹුරුවක් දීමට බණ්ඩාරනායක මැතිනිය කෙරෙහි වූ දැඩි උනන්දුව පිළිබිඹු කරන අවස්ථාවක් ගෙනහැර දැක්වීමට මම කැමැත්තෙමි. නොබැඳි සමුළුව සමයේ දී, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය සේනක බිබිලේ ඖෂධ ක්ෂේත්‍රයේ කර තුබුණ පුරෝගාමී අධ්‍යයනයන් හුවා දක්වන ලෙස එතුමිය මට කියා සිටියාය. පිරිවැය සඵලත්වය රැකෙන ඖෂධ ප්‍රතිපත්ති සම්පාදනය අරභයා මහාචාර්ය බිබිලේ කැපී පෙනෙන අධ්‍යයනයක් කර තුබුණි. වෙළෙඳ නම් නොමැති, අනවශ්‍ය මිල ගණන් බැහැර කෙරෙන, මෙම ප්‍රතිපත්ති ශ්‍රී ලංකා රජය පිළිගෙන තුබුණි. බිබිලේ මහාචාර්ය තුමා ප්‍රවර්ධනය කළ එම ප්‍රතිපත්ති අද පොදු දෙයක් ලෙස සැළකුණ ද, 1970 දශකයේ දී එම ප්‍රතිපත්ති නව මංපාදන විප්ලවකාරී ස්වරූපයක් ඉසිලීය. මහාචාර්ය බිබිලේ පෞද්ගලිකව දැන හැඳිණ සිටි මැතිනිය ඔහු අපගේ නියෝජිත මණ්ඩලයට ඇතුළත් කර ඔහුගේ විශේෂඥ වෘත්තීය දැනුම, මා ද සාමාජිකත්වය දැරූ ආර්ථික කමිටුවට ලබාගන්නා ලෙස මට උපදෙස් දුන්නාය. බණ්ඩාරනායක මැතිනියගේ ඉල්ලීම මත ප්‍රාරම්භ කටයුතු විශාල ප්‍රමාණයක් මහාචාර්ය බිබිලේ කර තුබුණ හෙයින්, තුන්වන ලෝකයට අදාළ ඖෂධ ප්‍රතිපත්තියක් පිළිබඳ යෝජනාවක් සඳහා සමුළුවේ අනුමැතිය ලබා ගැනීමට හැකිවිය.

සමාන තනතුරුවල නියැළියන් සමග විවිධ කරුණු ගැන ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම සඳහා බණ්ඩාරනායක මැතිනිය විදේශ සංචාර බොහෝමයක යෙදුනාය. මෙම සෑම සංචාරයක දීම, එතුමියගේ අධිෂ්ඨානය වූයේ ශ්‍රී ලංකාවට ආර්ථික වශයෙන් වාසි ලබා ගැනීමය. 1973 වසරේ එතුමිය ඉරාකයට ගිය අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ උග්‍ර අවශ්‍යතාවයක් වූ ඛනිජ තෙල්, ඉතාමත්ම වාසිදායක පදනමක් මත සැපයීමට ඉරාක නායක සදාම් හුසේන් පොළඹවා ගැනීමට සමත් වූවාය. ඉරාක සංචාරයෙන් පසුව මැද පෙරදිග රටවල් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා, ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිරීක්ෂණය යටතේ කැබිනට් උප කමිටුවක් පිහිටුවන ලදී. එතුමියගේ ආසියාතික රටවල සංචාර ද එවැනි වාසි ලබා ගැනීමට හේතු විය. ජපාන සහ පිලිපීන සංචාරයන්හී දී ආර්ථික ආධාර ගැන එතුමිය අවධානයක් දැක්වූවාය. එතුමිය මොනම ප්‍රශ්නයක්වත් සුළු කොට තැකුවේ නැත. පිලිපීනයට ගිය අවස්ථාවේ දී දිසිදි පොල් පිළිබඳ ප්‍රශ්නය ගැන පිලිපීන ජනාධිපති මාකෝස් සමග සාකච්ඡා කළාය. පිලිපීනය සහ ශ්‍රී ලංකාව ප්‍රධාන දිසිදි පොල් අපනයන කරුවෝ වූහ. ලෝක වෙළෙඳ පොළේ දිසිදි පොල් මිල පහත බැස තුබුණ හෙයින් අපනයන රටවල්වලට අන්‍යෝන්‍ය වශයෙන් වාසි සැලසෙන උපාය මාර්ගයක් දියත් කිරීමට එතුමිය ජනාධිපති මාකෝස්ගේ සහාය පැතුවාය. කිංස්ටන්හී පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක රැස්වීම කෙරෙන අතර කිනියාවේ එවකට (පසුව ජනාධිපති වූ) උප ජනාධිපති එරප් මෝයි මුණගැසී තේ අපනයනය සහ මිල ගණන් පිළිබඳව ඒකාබද්ධ උපායමාර්ග ගැන මුලපිරීය. තේ අපනයන රටවල සංවිධානයක් සඳහා ශ්‍රී ලංකාව ඉදිරිපත් කළ යෝජනාව බිහි වූයේ මෙම සාකච්ඡාවෙනි. මෙය ද, 1977 රාජ්‍ය පෙරළියෙන් ක්‍රියාත්මක නොවූ තවත් ඵලදායී යෝජනාවකි.

## අවසන් මතක සටහන්

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසිවන ශතවර්ෂයේ වැදගත් ස්ථානයක සිටි දේශපාලන නායිකාවකි. එතුමියගේ ප්‍රබලතම ශක්තිය වූයේ අකලංක අවංක භාවය සහ තම ඇසුරට පත් වූ වෙනත් දේශපාලන නායකයින් සමග ඵලදායී සබඳතා ගොඩනගා ගැනීමට තුඩුදුන් පෞද්ගලික ප්‍රසන්නත්වයයි. වෘත්තීය ආර්ථික විද්‍යාඥයෙක් නොවුවත් ආර්ථික කරුණු ගැන මනා ප්‍රායෝගික බුද්ධියක් එතුමියට තිබුණි. දේශපාලන සහ ආර්ථික බලවේගයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධය ගැන පැහැදිලි වැටහීමක් ඇතුව ක්‍රියා කළ එතුමියට දේශපාලන කළමනාකරණයේ ආර්ථික පිරිවිතර ගැන පූර්ණ අවබෝධයක් තිබුණි. මෙය දේශීය මෙන්ම ජාත්‍යන්තර කටයුතුවලට අදාළ විය. විදෙස් ප්‍රතිපත්තියෙහිලා දේශපාලන සහ ආර්ථික ප්‍රශ්න ඒකාබද්ධව සැලකීමට එතුමිය පෙළඹුණේ මෙම දර්ශනය මත පිහිටාය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී සහ නොබැඳි සමුළුවේ දී ආර්ථික ප්‍රශ්න පිළිබඳව දැක්වූ කැපී පෙනෙන අවධාරණය හේතුවෙන් ප්‍රබල ජාත්‍යන්තර සහයෝගිතාවක් ගොඩනැංවීමට එතුමිය සමත් වූවාය. එකල පැවති උග්‍ර දේශපාලන මතභේදයන් ගැන අනවශ්‍ය අවධානයක් යොමු කිරීමට මෙම ජාත්‍යන්තර සංවිධාන උපයෝගී කරගත්තේ නම්, එවැනි සහයෝගීතාවයකට තුබුණ අවකාශය ඇහිරෙනු ඇත. එතුමිය පිළිබඳ මාගේ නොමැකෙන මතකය නම්, සංකීර්ණ දේශපාලන සහ ආර්ථික ප්‍රශ්න ගැන අවධානය යොමු වූ විට දී පවා පෙන්නුම් කළ හාස්‍යය විඳීමේ සහ ප්‍රකාශ කිරීමේ හැකියාවයි. මීට අමතරව එතුමියට නිලධාරීන්ගේ සහ රාජ්‍ය තාන්ත්‍රිකයන්ගේ දුබලකම් සහ අසම්මත ගති පැවතුම් ගැන අවබෝධයක් සෑම විටම තිබුණි.